# දැනුම කේන්ද්‍ර කරගත් සමාජයක් උදෙසා

## අධ්‍යාපනය තුලින්........



# ඉසුරු පාසල්

## ද්විතීයික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය





අධ්‍යාපන අමාත්‍යංශය



# ඉසුරු පාසලක් අවශ්‍ය ඇයි ?

ශරී. අංක 6697
වර්ග අංක 379
දිනය





- සම අධ්‍යාපනික අවස්ථාවන් සැමට ලබාදීම.
- සැලසුම් සහගතව භෞතික හා මානව සම්පත් සහිතව සහ ප්‍රතිඵල ඉලක්ක කරගත් වැඩ සටහන් පාසල තුල ඵලදායීව ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපනික ගැටළු නිරාකරණය කිරීම සඳහා මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නැණ ගුණ වැඩුම යටතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට එක් පාසලක් විශයෙන් අංග සම්පූර්ණ පාසලක් ඇති කිරීම.
- ග්‍රාමීය වශයෙන් දක්ෂතා හුවාදක්වන දරුවන් ජාතියේ විශිෂ්ඨ තලයකට ගෙන ඒම සඳහා මඟ පාදා දීම.
- ශ්‍රමිකයන්ට වඩා බුද්ධිමතුන් අධ්‍යාපන ක්‍රියාවලිය තුලින් ජාතියට පිරිනැමීම.
- විවිධ භාෂාවන් හැදෑරීමට අවස්ථාවන් ලබා දෙමින් ජාතිය අතර මනා බැඳීමක් ඇතිවන අවස්ථාවන් පාසල තුලින් බිහිකිරීම.
- සිසුන්ගේ කායික හා මානසික වර්ධනයට අවස්ථා ලබා දෙමින් ප්‍රියමනාප ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම.





# විවිධ ගැටලු හේතුවෙන් පාසල් ව්‍යූහයේ ඇති වී තිබෙන තත්ත්වයන්





- ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික පාසල් කරා සිදු වන ශිෂ්‍ය ගලනය හේතුවෙන් ප්‍රවාහන පද්ධතියට සිදුව ඇති බලපෑම.

- පෝෂ්‍යදායී ආහාර ගැනීමකින් තොරව දීර්ඝ වේලාවක් වාහනවල ගමන් කිරීම හේතුවෙන් සිසුන්ගේ කායික හා මානසික වර්ධනයට සිදු වන බලපෑම.

- සුපිරි පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමට දෙමාපියන් තුළ පවතින තරඟකාරීත්වය හේතුවෙන් පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේ දී සිදුවන දූෂණ හා අක්‍රමිකතා ඉහළ යෑම.

- නාගරික විශාල පාසල් පරිපාලනය කිරීමේ අපහසුතාව හේතුවෙන් විනය පිරිහීම.

- ජනප්‍රිය පාසල්වල ප්‍රාථමික පන්තිවල ශිෂ්‍ය සංඛ්‍යාව අධික වීම හේතුවෙන් දක්ෂතා ඇති පහ වසර ශිෂ්‍යත්වධාරීන්ට හය වන ශ්‍රේණියේ දී එම පාසල ලබා දීමට නොහැකි වීම.

- අධ්‍යාපන අමාත්‍යංශයේ නිලධාරීන් සහ කලාප අධ්‍යාපන බලධාරීන් පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේ කාර්යයට සඳහා වැඩි කාලයක් යෙදවීම නිසා ගුණාත්මක අධ්‍යාපන සංවර්ධන වැඩ සටහන්වල නිරත වීමට කාලයක් නොමැති වීම.

- …රප්‍රසාද සහිත සිසුන්ට නගර ආශ්‍රිත පහසුකම් සහිත …ාසල්වල අධ්‍යාපන අවස්ථා සලසන අතර වරප්‍රසාද රහිත …සුන් අඩු පහසුකම් සහිත ග්‍රාමීය පාසල්වල රැඳීම …ේතුවෙන් අධ්‍යාපන සම අවස්ථා සැපයීම පිළිබඳ ප්‍රතිපත්ති …උල්ලංඝණය වීම.







# ඉසුරු පාසලකින් ලබා දීමට අපේක්ෂිත පහසුකම්








- ප්‍රමාණවත් ඉඩකඩ සහිත පංති කාමරවල ඉගෙනුම් අවස්ථාවන්.
- අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විද්‍යාගාර පහසුකම්.
- අන්තර්ජාල පහසුකම් සහිත පරිගණක හා පුස්තකාල පහසුකම්.
- රටට අවශ්‍ය හා දිවිපෙවෙතට ගැලපෙන වෘත්තීය ඉගෙනුම් පහසුකම් ඇතුලත් ගෘහ විද්‍යාගාර - කෘෂි විද්‍යාගාර හා විවිධ කාර්මික හැකියාවන් සඳහා පහසුකම්.
- විවිධ භාෂා මාධ්‍ය ඉගෙනුම් අවස්ථාවන්.
- ක්‍රීඩා හා සෞන්දර්ය වැනි කුසලතාවයන් විකසිත කර ගනිමින් ලබන ඉගෙනුම් අවස්ථාවන්.
- ආචාර්ය මණ්ඩලය හා විදුහල්පති සඳහා නේවාසික පහසුකම්.



# ඉසුරු පාසලක් සඳහා තෝරාගැනීමේදී සැලකිය යුතු කරුණු

- දිස්ත්‍රික්කය තුළ ඇති දරිද්‍රතා මට්ටම අනුව වැඩි දරිද්‍රතාවක් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් ආශ්‍රිතව පිහිටීම.
- මාර්ග හා ප්‍රවාහන පහසුකම් පැවතීම.

REFERENCE

- පාසල් භූමිය සංවර්ධනය සඳහා ප්‍රමානවත් ඉඩ කඩ පැවතීම.
- ජලය විදුලිය දුරකතන පහසුකම් ආදිය පාසලේ හෝ ආසන්නයේ තිබීම.
- ප්‍රාදේශීය සංවර්ධනයට සම්බන්ධ ජන ව්‍යාප්තියට සම්බන්ධ ස්ථානයක් වීම.
- ඉසුරු පසල ඒකාබද්ධ කල හැකි ප්‍රාථමික විද්‍යාල කිහිපයක් ආසන්නයේ පිහිටීම. සහ තෝරා ගන්නා පාසල්වල ද්විතීයික අංශය වෙනමත් ක්‍රියාත්මක කිරීමට පුළු [illegible] තිබීම
- රෝහල්, තැපැල් කාර්යාල, බැංකු ආදිය සහ රජයේ වෙනත් ආයතන ආසන්නයේ පිහිටා තිබීම.
- වාහන තදබදය ඇති අවිවේකී පරිසරයන් මඟහරවමින් ඇති උප නගරාශ්‍රිත වීම.

# ද්විතීයික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ ඉසුරු පාසල් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස

## බස්නාහිර පළාත

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස | දරිද්‍රතා දර්ශකය |
|---|---|---|
| කොළඹ | හංවැල්ල | 14.2 |
| | කොළඹ | 12.1 |
| | පාදුක්ක | 10.7 |
| | මොරටුව | 10.3 |
| | කොලොන්නාව | 8.2 |
| | හෝමාගම | 6.4 |
| ගම්පහ | දොම්පේ | 21.1 |
| | මීරිගම | 18.2 |
| | අත්තනගල්ල | 15.4 |
| | දිවුලපිටිය | 13.7 |
| | මිනුවන්ගොඩ | 12.5 |
| | මහර | 12.1 |
| කළුතර | වලල්ලාවිට | 31.4 |
| | පාලින්දනුවර | 30.7 |
| | මතුගම | 29.4 |
| | බුලත්සිංහල | 27.4 |
| | අගලවත්ත | 26.4 |
| | බේරුවල | 22.1 |

## මධ්‍යම පළාත

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස | දරිද්‍රතා දර්ශකය |
|---|---|---|
| මහනුවර | උඩුදුම්බර | 37.5 |
| | මිණිපේ | 37.5 |
| | දෙල්තොට | 34.0 |
| | පන්විල | 33.8 |
| | මැදදුම්බර | 29.8 |
| | ගඟ ඉහළ කෝරළේ | 27.7 |
| මාතලේ | අඹන්ගඟ කෝරළේ | 34.8 |
| | ලග්ගල-පල්ලේගම | 34.6 |
| | යටවත්ත | 29.9 |
| | පල්ලෙපොළ | 26.5 |
| | විල්ගමුව | 24.9 |
| | නාඋල | 24.3 |
| නුවර එළිය | වලපනේ | 26.5 |
| | හඟුරන්කෙත | 34.6 |
| | අඹගමුව කෝරළේ | 22.9 |
| | කොත්මලේ | 22.3 |
| | නුවර එළිය | 21.9 |

## දකුණු පළාත

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස | දරිද්‍රතා දර්ශකය |
|---|---|---|
| ගාල්ල | නෙළුව | 33.4 |
| | තවලම | 29.5 |
| | හබරාදුව | 28.7 |
| | නාගොඩ | 28.7 |
| | වැලිවිටිය - දිවිතුර | 25.5 |
| | හික්කඩුව | 24.9 |
| මාතර | හක්මන | 32.0 |
| | මුලටියන | 30.9 |
| | පස්ගොඩ | 28.2 |
| | අතුරලිය | 27.8 |
| | තිහගොඩ | 27.2 |
| | කිරින්ද පුහුල්වැල්ල | 27.1 |
| හම්බන්තොට | සූරියවැව | 34.8 |
| | කටුවන | 34.3 |
| | ඕකේවෙල | 34.1 |
| | ලුණුගම්වෙහෙර | 33.5 |
| | වලස්මුල්ල | 33.4 |
| | අම්බලන්තොට | 33.3 |

## වයඹ පළාත

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස | දරිද්‍රතා දර්ශකය |
|---|---|---|
| කුරුණෑගල | රිදීගම | 32.7 |
| | පොල්පිතිගම | 30.0 |
| | ඇහැටුවැව | 26.2 |
| | ගල්ගමුව | 25.7 |
| | අලව්ව | 25.2 |
| | මාවතගම | 24.9 |
| පුත්තලම | කල්පිටිය | 45.3 |
| | මුන්දලම | 41.0 |
| | වනාතවිල්ලුව | 40.3 |
| | මහකුඹුක්කඩවල | 28.6 |
| | නවගත්තේගම | 26.4 |
| | පල්ලම | 26.1 |

## උතුරු මැද පළාත

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස | දරිද්‍රතා දර්ශකය |
|---|---|---|
| අනුරාධපුරය | පදවිය | 34.3 |
| | මහවිලච්චිය | 31.1 |
| | කැබිතිගොල්ලෑව | 27.7 |
| | හොරොව්පතාන | 24.9 |
| | තිඹිරිගස්වැව | 24.7 |
| | පලාගල | 23.8 |
| පොළොන්නරුව | වැලිකන්ද | 24.7 |
| | දිඹුලාගල | 22.5 |
| | ඇළහැර | 18.4 |
| | ලංකාපුර | 14.5 |
| | තමන්කඩුව | 14.1 |
| | හිඟුරක්ගොඩ | 14.1 |

## ඌව පළාත

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස | දරිද්‍රතා දර්ශකය |
|---|---|---|
| බදුල්ල | මීගහකිවුල | 46.5 |
| | කන්දකැටිය | 46.1 |
| | රිදීමාලියැද්ද | 51.[illegible] |
| | ලුණුගල | 38.8 |
| | මහියංගණය | 38.5 |
| | හාලි ඇළ | 34.5 |
| | සොරණතොට | 34.2 |
| මොණරාගල | සියඹලාණ්ඩුව | 51.8 |
| | මඩුල්ල | 40.7 |
| | තණමල්විල | 35.8 |
| | මැදගම | 30.2 |
| | මොණරාගල | 29.3 |
| | බඩල්කුඹුර | 27.9 |

## සබරගමුව පළාත

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස | දරිද්‍රතා දර්ශකය |
|---|---|---|
| රත්නපුර | ඇලපාත | 40.1 |
| | වැලිගෙපොල | 39.2 |
| | ගොඩකවෙල | 38.2 |
| | කොළොන්න | 37.7 |
| | කලවාන | 36.4 |
| | ඕපනායක | 34.1 |
| කෑගල්ල | අරණායක | 36.1 |
| | දැරණියගල | 33.6 |
| | බුළත්කොහුපිටිය | 32.5 |
| | යටියන්තොට | 30.1 |
| | දෙහිඕවිට | 29.3 |
| | රඹුක්කන | 29.1 |

## තෝරාදීමෙන් පසුව

### උතුරු පළාත

| දිස්ත්‍රික්ක | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස |
|---|---|
| 05 | 30 |

### නැගෙනහිර පළාත

| දිස්ත්‍රික්ක | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස |
|---|---|
| 03 | 18 |

**මුළු පාසල් එකතුව 150**

## නැණ ගුණ වැඩුම

### ජාතික අධ්‍යාපන වැඩසටහන

නිදහස් අධ්‍යාපනය සඳහා අපේ දරුවන්ට ඇති අයිතිය කිසිසේත් අහෝසි නොකරමි. සිසු සිත් බැඳෙන විෂය නිර්දේශයක් සකසා බස මැනවින් ප්‍රගුණ කළ ගුරු සංචිතයක් බිහි කර සෑම සිංහල දරුවෙකුටම දෙමළ භාෂාවත්, දෙමළ භාෂාව මව් බස කරගත් සෑම දරුවෙකුටම සිංහල භාෂාවත් ඉගැන්වීමට කඩිනම් පදනමක් යටතේ පියවර ගන්නෙමි.

මින්මතු කිසිදිනක අපේ දරුවන්ට කුසගින්නේ අකුරු කරන්නට මම ඉඩ නොතබමි. සෑම පාසල් දරුවෙකුටම දිවා ආහාරය සඳහා බත් වේලක් දීමට මම කටයුතු කරමි.

රට පුරා ඇති සියලුම මහ විදුහල් සහ මැදි මහ විදුහල් වලට අවශ්‍ය උසස් පෙළ විද්‍යාගාර, සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන් ඉගැන්වීමට පදනම් කර ගත් භාෂා මධ්‍යස්ථාන, පරිගණකාගාර, පුස්තකාල, ක්‍රීඩාගාර ඇතුළු සියලු පහසුකම් ලබා දී පරිපූර්ණ පාසල් වශයෙන් ඒවා උසස් තත්වයට නංවන්නෙමි. ඒ අතරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක බැගින් තෝරාගත් පාසල් 325 ක් අග්‍රගණ්‍ය පාසල් ලෙස වැඩි දියුණු කෙරෙණු ඇත.

විශ්ව ගම්මාන සංකල්පය තුළ බරපතල අපහසුතාවයකට පත්ව සිටින අපේ දරු පරපුර ඉන් මුදවා ගැනීම සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් සන්නද්ධ කිරීම ජාතික අවශ්‍යතාවයකි. එහෙයින් ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව වර්ධනය කිරීමට ඉහළම ප්‍රමුඛත්වය ලබා දෙන්නෙමි. සෑම ශ්‍රී ලාංකික දරුවෙකුම ඉංග්‍රීසි බසෙහි ප්‍රවීණයෙකු කිරීම සඳහා ඉදිරි දස වසර පෙළ ගස්වනු ඇත.

**මහින්ද චින්තන 'දිනවමු ශ්‍රී ලංකා' පිටු අංක 63 උපුටා ගන්නා ලදී.**



இசுறு பாடசாலை ඉසුරු පාසල් ISURU Schools

වැඩසටහන් කළමණාකරු ( ඉසුරු පාසල් )
ඉසුරු පාසල් වැඩසටහන් කාර්යාලය
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

දුරකතන :- 011-2787105
ෆැක්ස් :- 011-2784362

ජනාධිපති කාර්යාලයේ පුස්තකාලය